

ජගත් ජේ එදිරිසිංහ

# කාව

13

දීර්ඝ රාත්‍රිය දැඩි උණුසුමින් පිරුණක් විය. මැදියමේ සිරිපොදයක් ඇද වැටුණද ගිනිගත් පරිසරය නිවාලන්නට එය සමත් නොවීය. අමාත්‍යාංශයේ සිනමාපටය සඳහා විසිරුණ අදහස් කීපයක් එක්තැන් කර යම් කතාවක් ගොඩ නගන්නට විදුල රාත්‍රිය වැය කර තිබුණි. මේසය මත වූ සිගරට් කොට පිරුණ අලු බඳුන අත වැදී බිඳී ගියේ අලුයම් යාමයේදීය. තේ කෝප්පයක් සාදාගත් ඔහු එයද අතැතිව මිදුලට බැස්සේය. නෙතබරිත සිසිල් සුළඟ ඔහුට පහසුවක් ගෙන ආවේය. අන්ධකාරය තවමත් හරිහැටි පහව ගොස් නැති නමුත් විහඟ ගී ඇරඹී තිබුණි. ඒ අතරින් දුරකතනයේ නාදය විදුලට ඇසුණි. නිරාශා විය යුතුය. නැවත නිවස තුළට ගොස් ඒ ඇමතුමට ප්‍රතිචාර දක්වන්නට ඔහුට නොසිතුණි. අතෙහි වූ දුම්වැටියේ අවසාන දුම් උගුරු කීපය නිමා කරනා තෙක් ඔහු මිදුලටම වී සිටියේ ය.

විදුල දුරකතනය අතට ගත්තේ නිරාශා දෙතුන්වරක් උත්සාහ කළ පසුව ය. මේ උදෑසන තමන් ගෙන එන මේ ආරංචියෙන් විදුල උද්දාමයට පත් වනු ඇතැයි නිරාශා බලාපොරොත්තු වූවාය. එනමුදු තමන්ගේ සිනමාපටයට මුදල් යොදවන්නට හසන්ත ඇලදෙණිය කැමැත්තෙන් සිටින්නේ යයි නිරාශා මහත් උද්යෝගයෙන් ගෙන ආ පුවත විදුල අසා සිටි උදාසීන විලාසය ඇගේ සිතේ ඇති කළේ විමතියකි.

"තේරුමක් නැහැ.." ඇගේ ආලවට්ටම් සහිත දීර්ඝ විස්තරය අවසන ඔහු කීවේ ය.

"ඇයි තේරුමක් නැහැ කියන්නෙ..? ඔයා මෙච්චර දවසක් මහන්සි වුණේ ප්‍රොඩියුසර් කෙනෙක් හොයන්නනෙ.."

විදුල තත්පර කීපයක් කල්පනා කරමින් සිටියේය. තමා සමදරාගේ ඉල්ලීමට අවනත වූ බව නිරාශාට කියන්නට ඔහුගේ සිත පසුබෑ-වේය. වරදකාරී සිත පීඩා කරයි.

"කාරණා දෙකක් තියෙනව නී... මං ඊයෙ සාමට කැමැත්ත දුන්නා එයාලගෙ මිනිස්ටර්ගෙ ඩොකියුෆිල්ම් එක කරල දෙන්න.. මං ඒ වැඩේට කැමැත්ත දුන්නෙ ඒ ලැබෙන සල්ලි වලින් මගේ ෆිල්ම් එක කරන අදහසින් කියලත් මං සාමට කිව්වා.. දැන් එයා ඇමතිටත් කියල ඉවරයි.. මට දැන් වචන වෙනස් කරන්න බැහැ.." දුරකතයෙන් ඇසෙන විදුලගේ වදන් නිරාශා අසා සිටියේ විමතියෙනි. ඔහු මේ කියන්නේ අදහාගත හැකි දෙයක්ද? කිසිවකින් කිසිදා නොසැලෙන්නේ යයි සිතා සිටි ඔහුගේ දැවැන්ත පෞරුෂයට කුමක්වීද?

"විදුල .." නිරාශා කෑගැසුවාය. "..පිස්සුද විදුල... ඔයා මොකද්ද මේ කරගත්ත මෝඩ වැඩේ..?" ඇය ඇසුවේ සිතට වන් කෝපය සඟවාගන්නට උත්සාහ නොකරමින්ය. "..ඔය තීරණය ගන්න කලින් ඔයාට තිබුණ මගෙන් අහන්න.."

"ඇයි මං ඔයාගෙන් අහන්නෙ..? එහෙම එකඟතාවක් අපි අතරෙ තිබ්බෙ නැහැනෙ.. ඔයා ඔයාගෙ තීරණ ස්වාධීනව ගන්නව වගේ මාත් මගේ තීරණ ස්වාධීනව ගන්නව.. මං ඔයාගෙන් බලාපොරොත්තු නොවෙන දෙයක් ඔයා මගෙන් බලාපොරොවෙන්න එපා.. එච්චරයි."

ඔහු කියන්නේ සැබෑවක් නමුත් ඒ වදන් ඇගේ සිත වේදනාවට පත් කළේය. ඔහු වක්‍ර ලෙස තමාට එල් කළේ දරුණු පහරකැයි ඇයට සිතුණි. ඔහුට දිය හැකි පිළිතුරක් සිතා ගත නොහැකිව ඈ තත්පර කීපයක් නිහඬව සිටියාය. කලින් තීරණය කරගත් එකඟතා මාලාවක් යටතේ පමණක් සියල්ල තීරණය වන බැඳීමක් පැවතිය හැකිදැයි ඒ තත්පර කීපයේ ඇය සිතමින් සිටියාය.

"මොකද්ද දෙවෙනි කාරණේ..?" නිහඬතාවෙන් අනතුරුව ඈ ඇසුවාය.

"මං දන්නෙ නැහැ හසන්ත මගේ ෆිල්ම් එක ප්‍රොඩියුස් කරන්න මේ තරම් කැමැත්තෙන් ඉදිරිපත් වෙන්නෙ ඇයි කියල.. සමහරවිට එයා කැමති ඇති ඔයාට එයාගෙ තවත් ෆිල්ම් එකක අවස්ථාව අරන් දෙන්න.. ඒත් නී ඔයා දන්නවා මගේ ෆිල්ම්ස් වල නලු නිලියන් තෝරන්නෙ මම.. ඒ අයිතිය ප්‍රොඩියුසර්ට දෙන්න බැහැ.. ප්‍රොඩියුසර් කෙනෙක් එහෙම ඉල්ලනවටවත් මං කැමති නැහැ..." ඔහු කියනු ඈ සා-වධානව අසා සිටියාය. වඩාත් දරුණු, ඉවසාගත නොහැකි වේදනාවක් ගෙනදුන් වාක්‍යය ඔහු කීවේ ඉන් අනතුරුවය. "...කො-හොම වුණත් මගේ ෆිල්ම් එකේ ඔයාට දෙන්න රෝල් එකක් නැහැ නී.."

ඔහුගේ වදන් අදහාගත නොහැකිව ඈ නිරුත්තර වූවාය. හෘද ස්වන්දනය මොහොතකට නතරවූවාක් මෙන් ඇයට දැනුණි.

"විදුල .." ඇගේ සසළ වූ කටහඬ ඔහුට ඇසුණි. "..ඒ කියන්නෙ.. ඒ කියන්නෙ ඒ ෆිල්ම් එකේ මේන් රෝල් එක කරන්නෙ මං නෙ-වෙයිද?"

"ඔව් නී.... ඒක තමයි මං කිව්වෙ.." ඔහුගේ කටහඬ සන්සුන් ය.

"ඔයා කොහොමද ඒ වගේ දරුණු තීරණයක් ගත්තෙ විදුල ..?" නිරාශා ඇසුවේ හැඬුම නවතාගන්නට උත්සාහ දරමින්ය. "මේන් රෝල් එක කරන්නෙ මං නෙවෙයි නං ඔයා කාවද තෝරගත්තෙ ..?"

වචන එක්රැස් කරගැනීම සඳහා විදුල තත්පර කීපයක් වැය කළේය. ඇය කෝප ගැන්වීමේ හෝ වේදනාවට පත්කිරීමේ හෝ අදහසක් ඔහු තුළ නොවීය. හැකි තරම් නිවැරදි ලෙස මෙය ඇයට තේරුම් කර දීම ඔහුගේ අභිප්‍රාය විය.

"මුලින්ම තේරුම් ගන්න ඒක මං ගන්න තීරණයක් නෙවෙයි නී.. ඒ ස්ක්‍රිප්ට් එකෙන් ඉල්ලන රූපය ඔයා නෙවෙයි... මං ඒ ස්ක්‍රිප්ට් එකට සාධාරණයක් කරන්න ඕනෙ..." ඔහු පැහැදිලි හඬින් කීවේය. "...තේරුම් ගන්න නී.. පොඩි ළමයෙක් වගේ හැසිරෙන්න එපා.. ඔයා දන්නවා මං හැම තිස්සෙම හැම චරිතයකටම හරියටම හරියන කෙනාව තෝරගන්න උත්සාහ කරන බව... මේකෙ මේන් රෝල් එක කරන්න හරියන කෙනෙක් මට තාම හොයාගන්න බැරිවුණා.. තාම මං ඒ ගැන හිතනවා"

"විකාර දොඩවන්න එපා විදුල .." නිරාශා මොර දුන්නාය. "මම ඒ රෝල් එකට ගැලපෙන්නෙ නැහැ කියල ඔයා තීරණය කළේ කොහොමද? මම ඔයිටත් වඩා බර කැරැක්ටර්ස් කලින් කරල නැද්ද..? ඔයාම ඒව ගැන මා එක්ක කොයි තරම් කතා කරල තියෙනවද? ප්‍රශංසා කරල තියෙනවද? ඔයා දන්නෑ විදුල .. වචනෙන් වචනෙ පිටුවෙන් පිටුව ඔයා සාංරගාගෙ චරිතෙ ගොඩනගනකොට මං කොයි තරම් ආසාවෙන් ඒක කියෙව්වද? ඔයා දන්නවා විදුල ඒ කැරැක්ටර් එක කරන්න මං කොයි තරම් පෙ-රුම්පුරාගෙන බලා හිටියද කියලා..?" නිරාශා අවසන් වාක්‍යය කීවේ ඉතා පහත් හඬකිනි. ඇය හඬනු ඔහුට පැහැදිලිව ඇසුණි.

තත්පර කීපයක අසහනකාරී නිහැඬියාවකට පසු ඔහු කතා කළේ ය.

"මං එහෙම දෙයක් දැනං හිටියෙ නැහැ නී.. ඔයා මට එහෙම දෙයක් කිව්වෙවත් නැහැ.. අනෙක් අතින් ඔයා එහෙම කිව්වත් ඒකෙන් වෙනසක් වෙන්නෙත් නැහැ.. මට මගේ ප්‍රතිපත්ති කඩන්න බැහැ.."

"ප්‍රතිපත්ති.." නිරාශා අවඥාවෙන් කෑගැසුවාය. "..ඔයාගෙ ප්‍රතිපත්ති හොඳයි ඔයාටම.. විලිලැජ්ජාවක් නැතුව අර ඇමතියගෙ පම්පෝරි වැඩේට හා කියනකොට ඔය ප්‍රතිපත්ති තිබුණෙ කොහෙද විදුල .. ඔයා මහ අවස්ථාවාදියෙක්.. ඔයාට ඕනෙ වුණෙ" මගේ හැකියාව මගේ ජීවිතේ ඔයාගෙ විකාර ලෝකය ඇතුලෙ හිරකරගෙන විනාශ කරන්න විතරයි.. ලෝකෙට මොන මූණ පෙන්නුවත් ඔයා මහ දුෂ්ඨ මිනිහෙක්.. ආත්මාර්ථකාමී මිනි-හෙක්.. ඔයා වෙනුවෙන් ජීවිතේම කැප කරපු මට ඔය විදිහට සළකන්න හිත හදාගන්න ඔයාට පුලුවන් වුනා නං තවත් මට ඔයා එක්ක කතා කරන්න දෙයක් නැහැ විදුල.. ඔයා මාව නැති කරගත්තා.." නිරාශාගේ ඉකි බිඳුම් හඬ අතරින්ම දුරකතනය විසන්ධි වනු විදුලට ඇසුණි.

නිරාශාගේ අවසන් වදන් කීපය හදවතට එල්ල කළ යවුල් පහරක් සේ ඔහු පීඩාවට පත් කළේය. මෙය මෙසේ විය හැකිද? ඇය තමා වටහා ගත් එකම ගැහැණිය යයි මෙතුවක් කල් සිතා සිටි ගැහැනියයි. ඇයද අවසන සාමාන්‍ය ගැහැනියක බවට පත්ව ඇතැයි දැනෙන විට ඒ වේදනාව තව තවත් දැඩිව ඔහුට දැනුණි.







තේරුම් ගත නොහැකි ව්‍යාකූල බවක් විදුල වෙලා ගෙන තිබුණි. නිර්මාණකරුවකුට සිය පුද්ගලික සම්බන්ධතා නොසළකා හැර තීරණ ගත නොහැකිද? නිරාශා තමා තේරුම් ගෙන ඇති ආකාරය නිවැරදිද? ඇය වෙනත් නිර්මා-ණකරුවකු යටතේ රංගනයෙහි යෙදීම පිළිබඳ ඊර්ෂ්‍යාවක් හෝ වෙනත් නොපහන් හැඟීමක් හෝ තම සිතේ වීද?

සාංරංගා අමරසූරිය ගේ චරිතය සඳහා විදුලගේ සිතේ ඇඳී තිබූ රුව නිරාශා නොවී ය. නිරාශාගේ මුහුණින් සැම විටම දිස්වුණ දීප්තිමත් බව කෙළිලොල් බව සහ ශරීර ස්වභාවය පවා මේ චරිතයට ආදේශ කළ නොහැකි බව විදුලට සිතෙයි. ඔහුට අවශ්‍ය වූයේ මදාරාගේ මෙන් නිවුණු ඇස් දෙකක් සහ තැන්පත් මුහුණක් ඇති එහෙත් දැඩි මානසිකත්වයක් පෙන්නුම් කරන නිළියකි. එවන් නිළියක් කෙසේ හෝ සොයා ගත යුතුය. එය අත්‍යවශ්‍යම කාරණයකි. නිරාශා සන්සුන් වූ පසුව ඇයට මෙය පැහැදිලි කර දිය යුතුය. ඇය තේරුම් ගනු ඇත.

**මතු සම්බන්ධයි**